# උතුරු ඉන්දියාවේ භජන් ගීතයන්හි අන්තර්ගත භක්ති රසය

***හේරත්, එච්. එම්. අයි. කේ. කෞශලා[1], කුමාරි, අයි.ඒ. සමන්ති සන්ධ්‍යා[2], මධුභාෂිණී, ඒ. ඩබ්. නිමේෂා[3]***

උතුරු ඉන්දියාවේ භජන් ගීත තුළ ඇති භක්ති රසය හඳුනාගන්නේ කෙසේද? යන්න මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වේ. මේ සඳහා පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් සාහිත්‍යයික මූලාශ්‍රය, පූර්ව පර්යේෂකයින්ගේ පර්යේෂණ ග්‍රන්ථ ආශ්‍රයෙන් ලබාගත් තොරතුරු හා ශ්‍රව්‍ය දෘශ්‍ය මූලාශ්‍ර භාවිත කරනු ලැබේ. භජන් ගායනයන්හි තුළ ඇති අර්ථය, නාද මාලාව, ඉදිරිපත් කිරීම ඔස්සේ එහි ඇති භක්ති රසය හඳුනාගැනීමට බලාපොරොත්තු වේ. භජන් ගීතයේ ආරම්භය සඳහා දහතුන්වන සියවසේ ජයදේවගේ '**ගීතගෝවින්දය**' මූලාශ්‍රය වී ඇත. හින්දී භාෂාවෙන් අර්ථ ගැන්වී දේව ඇදහිලි මුල් කරගෙන භජන් ගීත නිර්මාණය වී ඇත. ගීතගෝවින්දය භජන් ගීත ගැයීමට රාග නම් කොට ඇත. මාලව, වසන්ත, ගුර්ජරී, රාම්කලී, ගෞඩ් ඒ අතර වේ. සරල තාල භජන් ගීත සඳහා යොදා ගනියි. ඒක්තාරය, දෝතාරය යන සංගීත භාණ්ඩ යොදා ගනිමින් නාද මාලාව සැකසී ඇත. දෙවියන් උදෙසා බැතිමතුන් සාමුහික ගායනය අතරතුර මුද්‍රා හා සංඥා මගින් භක්ති රසය ඉදිරිපත් කරයි. අර්ථය, නාද මාලාව, ඉදිරිපත් කිරීම යන කාරණා තුන මූලික කර ගනිමින් භජන් ගායනා දෙකක් ඇසුරින් යථෝක්ත කාරණාව සාධනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

**ප්‍රමුඛ පද** ඃ භජන් ගීත, භක්ති රසය, උතුරු ඉන්දියාව, අර්ථය, නාද මාලාව

*[1]ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, දෘශ්‍ය කලා හා සැලසුම්කරණ හා ප්‍රාසාංගික කලා අධ්‍යයන ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය.* isuriherath93@gmail.com

*[2] ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, දෘශ්‍ය කලා හා සැලසුම්කරණ හා ප්‍රාසාංගික කලා අධ්‍යයන ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය.* samanthisandya77@gmail.com

*[3]ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, දෘශ්‍ය කලා හා සැලසුම්කරණ හා ප්‍රාසාංගික කලා අධ්‍යයන ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය.*